## පළමුවන කියැවීම

ක්‍රියා 5:27-32, 40-41

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

**ශුද්ධාත්මයාණෝ අප සමඟ මීට සාක්ෂි දරන්නාහ.**

දේව මාළිගාවේ සේනාධිපතියා සිය මුර සේවකයන් සමඟ අපෝස්තුළුවරුන් ගෙනවුත් මන්ත්‍රණ සභාව ඉදිරියෙහි සිටෙව්වෝ ය. උත්තම පූජකයා ඔවුන් අමතා, "මේ මිනිසාගේ නාමයෙන් නූගන්වන ලෙස අපි ඔබට අණ කෙළෙමු. එහෙත් ඔබ, ඔබගේ මේ ධර්මය ජෙරුසලම පුරා පතළ කර, මේ මිනිසාගේ මරණය ගැන අප වගකිව යුත්තන් කරන්නට අදහස් කරන්නහු දැ"යි ඇසූ හ. එවිට පේදුරු සහ අපෝස්තුළුවරු පිළිතුරු දෙමින්, "අප මිනිසුන්ට නොව දෙවියන් වහන්සේට කීකරු විය යුතු ය. අප පියවරුන්ගේ දෙවියන් වහන්සේ, ඔබ විසින් කුරුසියක එල්ලා මරණයට පත් කළ ජේසුස් වහන්සේ උත්ථාන කොට වදාළ සේක. එම තැනැන් වහන්සේ නායකයාණන් ද ගැළවුම්කාරයාණන් ද වන පිණිස දෙවියන් වහන්සේ සිය දකුණතින් දකුණතට උසස් කර වදාළ සේක. එසේ කෙළේ, ඉශ්රායෙල්ට මනස්ස්ථාපනයත් පව් කමාවත් දෙන පිණිස ය. මේ කරුණුවලට අපි සාක්ෂිකාරයෝ වෙමු. දෙවියන් වහන්සේට කීකරු වන අයට ප්‍රදානය කර ඇති ශුද්ධාත්මයාණන් වහන්සේ ද අප සමඟ, සාක්ෂිකාරයෙක් වන සේකැ"යි කී හ. ඉන්පසු ඔව්හු අපෝස්තුළුවරුන් තමන් වෙතට ගෙන්වා, කස පහර දී, ජේසුස් වහන්සේගේ නාමයෙන් කතා නොකරන්නට අණ කොට ඔවුන් නිදහස් කර යැවූ හ. එවිට අපෝස්තුළුවරු ඒ නාමය උදෙසා නින්දා විඳීමේ භාග්‍යය ගැන ප්‍රීති වෙමින්, මන්ත්‍රණ සභාවෙන් ඉවත් ව ගියහ.

දේව වාක්‍යය එසේ ය. | දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 30:2-5, 10, 11a, 12b

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේ මාගේ අයැදුම ඇසූ සේක.
මට සුව සෙත දුන් සේක. ආලේලූයා! ආලේලූයා!

ගීය: මාගේ දෙවි සමිඳුනි, ඔබට යාදිනි කීවෙමි, ඔබ මට සුව සෙත දුන් සේක. සමිඳුනි, ඔබ පාතාලයෙන් මා ගොඩ ගත් සේක; මා වළ පල්ලට නොයන පරිදි ඔබ මා දිවි රැකගත් සේක.

පින්වතුනි, සමිඳුන්ට ගී පසස් නඟන්න; ඒ නිර්මල නාමයට තුති ගී ගයන්න. මන්ද, එතුමන්ගේ උදහස ඇසිල්ලකට පමණ ය. එතුමන්ගේ කරුණාව දිවි ඇති තාක් ය. රැයේ හැඬීම පවතියි; උදය ප්‍රීතිය උදා වෙයි.

සමිඳුනි, සවන් දී මට කරුණා කළ මැනව. සමිඳුනි, ඔබ මාගේ සරණ වුව මැනව. ඔබ මාගේ දොම්නස සොම්නසට හැරෙවූ සේක. මාගේ දෙවි සමිඳුනි, සදහට ම ඔබ හට ගී ගයන්නෙමි.

## දෙවන කියැවීම

එළිදරව්ව 5:11-14

එළිදරව්ව පොතෙන් ගත් කොටසකි.

**"මරා දමන ලද අජබාලකයාණෝ ගෞරවය ද මහිමය ද ලබන්නට සුදුසු ය."**

එවිට මා බැලූ කල, සිංහාසනය ද ජීවමාන සත්ත්වයන් ද කුලදෙටුවන් ද සිසාරා සිටි මහා දේව දූත පිරිසක් දිටිමි. ඔවුන්ගේ හඬ ද මට ඇසුණේ ය. ඔවුන්ගේ

ගණන දස දහසක් වර දස දහසක් ද දහස් වර දහසක් ද විය. ඔව්හු මහ හඬින් මෙසේ කී හ: "මරනු ලැබූ බැටළු පෝතකයාණෝ බලය ද ධනය ද ප්‍රඥාව ද පරාක්‍රමය ද ගෞරවය ද මහිමය ද ප්‍රශංසාව ද ලබන්නට සුදුසු තැනැන් වහන්සේ ය." තවද, ස්වර්ගයෙහි ද පොළොවෙහි ද පොළොව යට ද මුහුදෙහි ද යන මුළු ලෝකයෙහි ඇති සියලු සත්ත්වයන්: "සිංහාසනයෙහි වැඩ සිටින තැනැන් වහන්සේටත්, බැටළු පෝතකයාණන්ටත් ප්‍රශංසාව ද ගෞරවය ද මහිමය ද පරාක්‍රමය ද සදහට ම වේ වා!"යි කියනු ඇසීමි. ජීවමාන සත්ත්වයෝ සතර දෙනා ද "ආමෙන්" යයි කී හ. කුලදෙටුවෝ වැඳ වැටී නමස්කාර කළහ.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ලූක් 24:32

ආලේලූයා! ආලේලූයා!
ජේසුස් සමිඳුනි, දේව වාක්‍යය අපට ද පහදා දුන මැනව.
ඔබ අප සමග කතා කරන විට අපේ හදවත් දැවී යන්නට සලසනු මැනව.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ජුවාම් 21:1-19

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ස්වාමීන් වහන්සේ ස්වකීය උත්ථානයෙන් පසු ශ්‍රාවකයන්ට ප්‍රකාශ වූ තුන්වන අවස්ථාව**

ජේසුස් වහන්සේ තිබේරියස් නම් මුහුද ළඟ දී ශ්‍රාවකයන්ට නැවත දර්ශනය වූ සේක. උන් වහන්සේ දර්ශනය වූයේ මේ අයුරින් ය. සීමොන් පේදුරු ද 'නිවුන් දරුවා' නම් වූ තෝමස් ද ගලීලයේ කානාහි නතානියෙල් ද සෙබදීගේ පුත්‍රයෝ ද උන් වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් තවත් දෙදෙනෙක් ද එක් ව සිටියෝ ය. සීමොන් පේදුරු, "මම මසුන් අල්ලන්න යමි"යි ඔවුන්ට කී ය. "අපිත් ඔබ සමග එමු"යි ඔව්හු ඔහුට කී හ. ඔව්හු පිටත් ව ගොස් ඔරුවට නැංගා හ. එහෙත් ඒ රාත්‍රියේ ඔවුන් කිසිවක් ඇල්ලූවේ නැත. පහන් වූ කල ජේසුස් වහන්සේ වෙරළෙහි සිටි සේක. එසේ වුවත්, ඒ ජේසුස් වහන්සේ බව ශ්‍රාවකයෝ නොදත්හ. එවිට ජේසුස් වහන්සේ, "මිත්‍රයෙනි, ඔබ ළඟ මාළු තිබේ දැ"යි ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු, "නැතැ"යි කී හ. උන් වහන්සේ ඔවුන් අමතමින්, "ඔරුවේ දකුණු පැත්තෙන් දැල හෙළන්න, එවිට සම්බ වනු ඇතැ"යි වදාළ සේක. එසේ දැල හෙළූ කල, අසුවූ මසුන් රාශිය නිසා දැල ඇද ගන්නට වත් ඔවුන්ට නොහැකි විය. ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා පේදුරුට කතා කොට, "අන්න, ඒ සමිඳාණන් වහන්සේ ය"යි කී ය. එවිට සීමොන් පේදුරු ඒ සමිඳාණන් වහන්සේ බව අසා, තමා ඉණ රෙද්ද ලිහාදමා සිටි බැවින්, වහා එය ඇඳගෙන මුහුදට පැන්නේ ය. එහෙත් සෙසු ශ්‍රාවකයෝ මසුන්ගෙන් පිරුණු දැල ඇදගෙන, කුඩා ඔරුවෙන් ආහ. ඔව්හු වෙරළට නුදුරු ව මීටර් සියයක් පමණ ඈතින් සිටියහ. ඔව්හු ගොඩට ආ විට එහි ගිනි අඟුරු ද ඒ පිට මාළු තිබෙන බව ද රොටි ද දුටුවෝ ය. "ඔබ දැන් ඇල්ලූ මසුන්ගෙන් ස්වල්පයක් ගෙනෙන්නැ"යි ජේ සුස් වහන්සේ ඔවුන්ට වදාළ සේක. සීමොන් පේදුරු ඔරුවට නැඟී, ලොකු මසුන් එකසිය පණස්තුන් දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට ඇද්දේ ය. එපමණ තිබුණ නමුත් දැල ඉරුණේ නැත. ජේසුස් වහන්සේ කතා කොට, "එන්න, අනුභව කරන්නැ"යි ඔවුන්ට වදාළ සේක. ඒ ස්වාමින් වහන්සේ බව ඔවුන් දැන සිටි හෙයින්, "ඔබ කවුරු දැ"යි උන් වහන්සේගෙන් අසන්නට ශ්‍රාවකයන්ගෙන් කිසිවෙකුට වත් ධෛර්යය

නොතිබිණි. ජේසුස් වහන්සේ ඇවිත්, පූප රැගෙන ඔවුන්ට දුන් සේක; එසේ ම මාළුත් දුන් සේක. මේ වනාහි ජේසුස් වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූ පසු ශ්‍රාවකයන්ට දර්ශනය වූ තුන් වන වතාව ය.

(මෙසේ ඔවුන් ආහාර වැළඳූ පසු ජේසුස් වහන්සේ සීමොන් පේදුරුට කතා කොට, " ජුවාම්ගේ පුත්‍ර වූ සීමොන්, මොවුන්ට වඩා ඔබ මට ප්‍රේම කරන්නෙහි දැ"යි ඇසූ සේක. ඔහු, "එසේ ය ස්වාමීනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේකැ"යි පිළිතුරු දුන්නේ ය. උන් වහන්සේ, "මාගේ බැටළු පැටවුන් පෝෂණය කරන්නැ"යි ඔහුට වදාළ සේක. නැවත දෙ වන වරටත්, " ජුවාම්ගේ පුත්‍ර වූ සීමොන් ඔබ මට ප්‍රේම කරන්නෙහි දැ"යි ඔහුගෙන් ඇසූ සේක. ඔහු, "එසේ ය, ස්වාමීනි, මා ඔබට ප්‍රේම කරන බව ඔබ දන්නා සේකැ"යි පිළිතුරු දුන්නේ ය. උන් වහන්සේ ද, "මාගේ බැටළුවන්ගේ එඬේරා වන්නැ"යි වදාළ සේක. උන් වහන්සේ තුන් වන වරටත් ඔහුට කතා කොට, " ජුවාම්ගේ පුත්‍ර වූ සීමොන්, ඔබ මට ප්‍රේම කරන්නෙහි දැ"යි ඔහුගෙන් ඇසූ සේක. තුන් වන වරටත්, 'මට ප්‍රේම කරන්නෙහි දැ'යි ජේසුස් වහන්සේ තමාගෙන් ඇසූ බැවින් පේදුරු ශෝක වී: "ස්වාමීනි, ඔබ සියල්ල දන්නා සේක; මා ඔබ වහන්සේට ප්‍රේම කරන බව ඔබ වහන්සේ දන්නා සේකැ"යි කී ය. "මාගේ බැටළුවන් පෝෂණය කරන්නැ"යි ජේසුස් වහන්සේ ඔහුට වදාළ සේක. "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ තරුණ වියෙහි ඔබේ ඉඟටිය බැඳගෙන කැමැති කැමැති තැන්වල ඇවිද්දෙහි ය. එහෙත් ඔබ මහලු වූ කල ඔබේ අත් දිගු කරන්නෙහි ය, වෙන කෙනෙකු ඔබේ ඉඟටිය බැඳ, ඔබ කැමැති නැති තැනකට ගෙනයනු ඇතැ"යි වදාළ සේක. ඔහු කෙබඳු මරණයකින් දෙවියන් වහන්සේ ගෞරවයට පමුණුවනු ඇද්දැ යි හඟවනු වස් උන් වහන්සේ මෙසේ වදාළ සේක. ඉක්බිති "මා අනුව එන්නැ"යි නැවතත් ඔහුට කී සේක.)

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.